**ශීර්ෂය - 223 ශ්‍රී ලංකා නාවික හමුදාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 223 ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 වර්ෂයේ නාවික හමුදාවේ ඉන්ධන සැපයීම් වැය ලෙජරයේ රු. 5,190,000,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 971,051,975 ක් හෙවත් සියයට 19 ක් වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන හා බාහිර ආයතන සඳහා නිකුත් කර තිබුණු අතර, එයින් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට අයවීමට තිබුණු රු. 22,548,339 ක් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | ආදායම් ශීර්ෂ වල පමණක් හිඟ ආදායම් පෙන්විය යුතු බැවින් අයවීමට තිබූ හිඟ බිල්පත් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003,2004 සහ 2015 යන වර්ෂයන් වලට අදාලව පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ණය ශේෂය රු.31,690,373ක වෙනසක් පැවතුණි. ඉන් 2005 වර්ෂයට පමණක් අදාල වටිනාකම රු.31,668,645ක්වූ අතර මෙම වෙනස පරීක්ෂා කිරීමට අදාල ලේඛන හා ගිණුම් සාරාංශ පිටපත් විගණනයට ඉදිරිපත් නොවුණි.<br><br>තවද ප්‍රවර්ථන වර්ෂය අවසානයේදී මෙම වෙනසේ වටිනාකම රු. 21,625,626 ක් වූ නමුත් මෙම වෙනස සම්බන්ධයෙන් කටයුතු කිරීමට පත්කර තිබූ කමිටුව මඟින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ පරිදි පියවරෙන් පියවර කපා හැරීමට තීරණය කරනු ලැබූ බැවින් රු.16,848,699 කට අදාළ කපාහැරීම් සඳහා ලිපිගොනු ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එම ශේෂය කපාහැරීමෙන් පසු දෙවන අදියරේදී පාලන ගිණුම හා කේවල ණය ශේෂ කපාහැරීම සඳහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.<br>මෙම වෙනස ඇති වූ ආකාරය පරීක්ෂා කිරීම සඳහා එම කාල සීමාවන්ට අදාළ ගිණුම් සාරාංශ නාවික හමුදාව තුළ නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල අනුමැතීන් ලබා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. එසේම අදාළ තොරතුරු ලේඛන ගිණුම් සාරාංශ ක්‍රමානුකූලව ගොනුකර තබා ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **වාණිජ අත්තිකාරම් ගිණුම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 504 අනුව වාණිජ අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යන අවස්ථාවක එක් එක් කාර්තුවක් අවසානයේ දී වෙළඳ ණය ගැතියන් පිළිබඳ, වෙළඳ ණයහිමියන් පිළිබඳ, අමු ද්‍රව්‍ය, ගබඩා භාණ්ඩ හා සැපයුම් පිළිබඳ සහ අත්තිකාරම් ගිණුම් සඳහා නියමිත සීමාවන් පිළිබඳ ප්‍රකාශයන් පිළියෙල කර එම කාර්තුවට පසුව එළඹෙන මාසයේ 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත පිටපතක් සහිතව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කල යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. එමෙන්ම එම වාර්තා මූල්‍ය ප්‍රකාශන සමඟ ද ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කාර්තුමය ගිණුම් පිළියෙල කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වුවද, 2022 වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන් 06 ක් සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් රු. 701,200,000 ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණි. | පුනරාවර්තන වැය විෂයයන් 06 ක් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් මෙම වටිනාකම පමණක් මාරු කරගෙන ඇත. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කල යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 21 දිනැති අංක 03/2021 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 04(6) වගන්තිය ප්‍රකාරව හා මුදල් රෙගුලාසි 94 (1) වගන්තිය ප්‍රකාරව නියම වශයෙන් මුදල් ගෙවීමට සිදු වන කාලය වන විට අවශ්‍ය අධිකාරි බලය හෙවත් අතිරේක මුදල් ප්‍රතිපාදන ලැබේ යැයි අපේක්ෂාවෙන් වියදම් හෝ බැරකම් හෝ නොදැරිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දී ප්‍රතිපාදන ඉක්මවා පුනරාවර්තන වැය විෂයයක් සඳහා රු.15,358,654 ක සහ ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා රු. 82,126,924 ක බැරකම්වලට එළඹ තිබුණි. | 2022 වර්ෂයේ ප්‍රතිපාදන කාර්තු වශයෙන් වෙන් කර එම කාර්තුවට ලබා දෙන ප්‍රතිපාදන සීමාව නොඉක්මවා වගකීම් වලට බැදී ඇත. විමසුමේ දක්වා ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කාර්තුවකට අදාල වෙන් කිරීම් ද කාර්තු හතරටම අදාල වෙන් කිරීම් ද යන්න පැහැදිලි නොමැත. | වැය විෂයයකට අදාලව ප්‍රතිපාදන මුදල් ඉක්මවා බැරකම් හා බැදීම් ඇති කර නොගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ නාවික හමුදාවට අදාළ නොවන වැය විෂයයන් 02 ක් වෙනුවෙන් රු.1,523,936 ක බැරකම් සඳහා එළඹ තිබුණි. | බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ 1203 වැය විෂයයට යායුතු වියදම මුද්‍රණ දෝෂයකින් 1206 වැය විෂය යටතේ රු.858,436 ක් හා 1207 වැය විෂය යටතේ රු.665,500 ක් සටහන් වී තිබුණි. | නිවැරදි වැය විෂය යටතේ සටහන් කල යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2018 ජූලි 16 දිනැති අංක 03/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ජාතික අයවැය චක්‍රලේඛය 07 ඡේදය. | අනුයුක්ත වාහනයක් සඳහා හිමිකම් ඇති නිලධාරියකු හිමිකම් ලබන්නේ එක් අනුයුක්ත වාහනයක් සඳහා පමණක් බවට සියළු රාජ්‍ය ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු බවත්, අනුයුක්ත වාහන භාවිතා කරනු ලබන නිලධාරීන් | ශ්‍රී ලංකා නාවික හමුදාවේ රියද් අද්මිරාල් තනතුරේ නිලධාරීන් උපායමාර්ගික මෙහෙයුම් මට්ටමේ කරුණු සහ රහසිගත තොරතුරු ද්‍රව්‍ය, වාර්තා පිළිබඳ කටයුතු කරයි. එබැවින් ඔවුන් වෙත වෙනම පුද්ගලික කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර ඇති අතර ආරක්ෂක ක්‍රියාමාර්ග ලෙස ඔවුන්ද | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | වෙනත් කිසිදු සංචිත වාහනයක් භාවිතා කිරීමට හිමිකම් කියනු නොලබන බවත් දක්වා තිබුණ ද, නාවික හමුදාවේ නිලධාරීන් 18 දෙනෙකු සඳහා අනුයුක්ත වාහන දෙක බැගින් වෙන්කර තිබුණි. | රැගෙන යන අවස්ථා පවතී. මෙම පවතින ක්‍රමවේදය වෙනස්කර එක් වාහනයක් වාහන සංචිතයට අනුයුක්ත කිරීමට සලකා බලනු ලබයි. | |
| (ආ) | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශ ලේකම්ගේ 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | (i) | පෙට්‍රල්/ ඩීසල් වාහන භාවිතා කරන, අනුයුක්ත කල නිල වාහන හිමිකම ඇති නිලධරයන්ට මාසිකව ලීටර් 135 ක් අනුමත කර තිබියදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයේ නියුතු සිවිල් නිලධාරීන් 03 දෙනෙක් වෙනුවෙන් රාජකාරී ගමන් සඳහා මසකට ලීටර් 365 ක් බැගින් හා ඒ අතරින් සිවිල් නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් පෞද්ගලික ගමන් සඳහා මසකට ලීටර් 125 ක් බැගින් අනුමත කර තිබුණි. | ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවය කරන සිවිල් නිලධාරීන් වෙත නාවික නිලයන්ට සමාන වරප්‍රසාද සහ පහසුකම් ලබා දීමට කර ඇති අනුමැතිය අනුව හමුදාවේ මාණ්ඩලික නිලධාරීන් සඳහා නිල වාහන පහසුකම් ලබාදෙන ක්‍රමවේදය වන නාවික නියෝග 325 අනුව නිල රථයක් ලබා දි ඇත. | රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | | (ii) | නාවික හමුදාපතිගේ අංක 0325 දරන නාවික නියෝගයේ 47 වගන්තිය මගින් හා 2020 පෙබරවාරි 13 දිනැති නා.හ. 05 දරන අභ්‍යන්තර චක්‍රලේඛය මගින් කමාන්ඩර් හා ඊට ඉහළ තනතුරු දරන නිළධාරීන් 583 ක් සඳහා පැවති රාජකාරී ඉන්ධන සීමාව ලීටර් 305 සිට 365 දක්වා ද, කොමදෝරු තනතුර හා ඊට ඉහළ තනතුරු දරන නිලධාරීන් 101 ක් සඳහා රාජකාරී ඉන්ධන ප්‍රමාණයට අමතරව පෞද්ගලික කටයුතු සඳහා ලීටර් 125 ක ඉන්ධන ප්‍රමාණයක් ද | 1978 වර්ෂයේ සිට මේ වන තෙක් ත්‍රිවිධ හමුදාවේ වාහන අනුයුක්ත කිරීම 1978 මාර්තු 23 දිනැති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශ ලේකම්ගේ ලිපිය ප්‍රකාරව ලබා දී ඇත. ත්‍රිවිධ හමුදා නිලධාරීන් පැය 24 තුළම රාජකාරීන් සිදු කිරීමට බැඳී සිටින අතර, දිගු ගමන් සඳහා නිල රථ භාවිතා කරනු ලබයි. එබැවින් මාණ්ඩලික නිලධාරීන්ගේ නිල වාහන සඳහා නාවික හමුදා නියෝග මගින් නිශ්චිත කිලෝ මීටර් ප්‍රමාණයක් ලබා දීම සිදු කර ඇත. එමෙන්ම රාජ්‍ය පරිපාලන සේවයට ලබා දී ඇති සියලු වරප්‍රසාදයන් සඳහා ත්‍රිවිධ හමුදාව සැම විටම හිමිකම් නොලබන බැවින් එම චක්‍රලේඛයන් සැමවිටම ත්‍රිවිධ හමුදාවට අදාල නොවිය. | මාසික ඉන්ධන ලීටර් ප්‍රමාණය සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අනුමත කර තිබුණ ද, ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2017 දෙසැම්බර් 21 දිනැති අංක 07/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය. | නාවික හමුදාව සතුව ඇති වාහන 59 ක් සඳහා චක්‍රලේඛය ප්‍රකාරව ලියාපදිංචි අයිතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන 03 ක් ලබාගත් පුද්ගලික ආයතන වර්තමානයේ නොපවතින බැවින් ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නාවික හමුදා නීති අංශයට යොමු කර ඇත. නාවික හමුදාවේ ප්‍රවාහන සංචිතය සතුව පවතින වාහන 50 ක් සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී ලියාපදිංචි කරවා ගැනිමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.4 (i) (ii) (iii) හා (iv) වගන්ති. | සමාලෝචිත වර්ෂයට අදාලව නියැදි විගණන පරීක්ෂාවට අනුව වටිනාකම රු. 66,345,710 ක් වූ රතු පොස්පරස් සහ උණ්ඩ මිලදී ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම් ක්‍රමය යටතේ සිදුකර තිබුණු අතර උපරිම තරගයක් තහවුරු කිරීම සඳහා විවිධ මාධ්‍ය මගින් ප්‍රසම්පාදන දැන්වීම් සඳහා ජාත්‍යන්තර වශයෙන් ප්‍රචාරයක් ලබාදිය යුතු බවට ප්‍රසම්පාදන අස්තිත්වයට නියම කරනු ලබන අතර ජාත්‍යන්තර වශයෙන් සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් සහභාගී වීමට අවකාශ ඇති රටවල තානාපති කාර්යාලවලට , වෙළඳ නියෝජිතයන්ට එම දැන්වීම ප්‍රේෂණය කිරීම සහ වෙබ් අඩවිවල එම දැන්වීම් පළකිරීම කළ යුතු වුවත්, ප්‍රසම්පාදන දැන්වීම ජාතික පුවත්පතක සහ නාවික හමුදා වෙබ් අඩවියේ පමණක් පළකර තිබීම හේතුවෙන් ජාත්‍යන්තර | වර්තමානයේ වාණිජ පුපුරණ ද්‍රව්‍ය ගිනි අවි සහ පතොරම් මිලදී ගැනීමේ ඒකකය වෙත පුපුරණ ද්‍රව්‍ය සහ ගිනි අවි සපයනු ලබන්නේ ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි දේශීය ආයතන මෙන්ම විදේශීය නිෂ්පාදන ආයතනයන්හි දේශීය නියෝජිතයින් හරහා වන අතර, මෙම ඒකකය මඟින් ජාතික පුවත්පත්වල සහ නාවික හමුදා වෙබ් අඩවියේ පල කරනු ලබන දැන්වීම් සඳහා දේශීය ආයතන මෙන්ම විදේශීය ආයතනයන්හි දේශීය නියෝජිතයින් විසින් ප්‍රතිචාර දක්වනු ලබයි. තවද ඉදිරියේදි විදේශ රටවල තානාපති කාර්යාලයන් වෙත අදාල දැන්වීම් ඉදිරිපත් කර ඔවුන්ගේ වෙබ් අඩවි තුල එම දැන්වීම් පල කිරීමෙන් ජාත්‍යන්තර සැපයුම්කරුවන්ට ප්‍රසම්පාදන කටයුතු සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

තරගකාරී සැපයුම්කරුවන්ට ප්‍රසම්පාදන කටයුතු සඳහා සහභාගී වීමට තිබූ අවස්ථා අවම වී තිබුණි.

## 2.4 වංචනික ස්වරූපයේ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගබඩා අත්තිකාරම් ගිණුමේ (පුපුරණ ද්‍රව්‍ය) 2017 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය මගින් අනාවරණය කර තිබූ රු.8,314,236 ක මූල්‍ය විෂමතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිම කර නොතිබුණි. | ගබඩා අත්තිකාරම් ගිණුමේ (පුපුරණ ද්‍රව්‍ය) 2017 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය මගින් අනාවරණය කර තිබූ රු. 8,314,236 ක මූල්‍ය විෂමතාවය සම්බන්ධ පරීක්ෂණ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෞද්ගලික ආයතනයක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා නාවික හමුදා කාර්ය මණ්ඩලය 2019 දෙසැම්බර් මස සිට යොදවා තිබූ අතර ඒ සඳහා ආයතනය සමග ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව අදහස් දක්වා නොතිබුණි. | වැඩ ආරම්භ කිරීමට ප්‍රථම ගිවිසුමකට එළඹිය යුතුය. |
| (ආ) | නාවිකයින් 25 දෙනෙකු මාස 06 ක කාලයක් ඉහත ව්‍යාපෘතිය වෙනුවෙන් යෙදවීමට ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් අනුමැතිය ලබා දී තිබුණි. නමුත් තවදුරටත් මාස 09 ක කාලයකට එකී ව්‍යාපෘතිය වෙනුවෙන් නාවිකයන් යෙදවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව නාවිකයින් 17 දෙනෙකු යොදවා තිබුණි. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පැවති කාලයේ, 2019 වසරේ ඇති වූ පාස්කු ප්‍රහාරය සහ ඉන් පසු රටෙහි පැවති තත්ත්වය ද, 2020 වසරේ මුල් භාගයේ සිට ඇති වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හා රට වසා දැමීමේ තත්ත්වය, පසුගිය කාල වකවානුවෙහි රටෙහි ඇති වූ අරගලය හේතුවෙන් වෙළඳ පොළෙහි අමුද්‍රව්‍ය හිඟකම | අතිරේක කාලපරිච්ඡේදය සඳහා ද නාවිකයින් යෙදවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | හේතුකොටගෙන ව්‍යාපෘති භාර දේවස්ථානයේ පියතුමන් හට නිසි වේලාවට ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වැඩ බිම වෙත ලබා දීමට නොහැකි විය. ඒ හේතුවෙන් ව්‍යාපෘතිය සැලසුම්කරන ලද කාල සීමාව තුල නිම කර ගැනීමට නොහැකි විය. | |
| (ඇ) | 2019 දෙසැම්බර් ආරම්භකර තිබූ මෙම ව්‍යාපෘතියේ කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් අනුමත මාස 06 ක කාල සීමාව තුළ පුහුණු නාවික මිනිස් දින 1505 ක් ද, සුපරීක්ෂක නාවික මිනිස් දින 109 ක් ද, යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් දළ වැටුප් වියදම රු.4,842,000 ක් වී තිබුණි. එමෙන්ම ව්‍යාපෘතිය සඳහා අතිරේක මාස 28 ක කාල පරිච්ඡේදය වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව සුපරීක්ෂක නාවික මිනිස් දින 639 ක්, පුහුණු නාවික මිනිස් දින 9201 ක් හා නාවික ඉංජිනේරු කාර්මික මිනිස් දින 61 ක් යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් ගණනය කල දළ වැටුප් වියදම රු. 23,486,800 ක් වී තිබුණි. ඒ අනුව පෞද්ගලික ආයතන වල ඉදිකිරීම් වෙනුවෙන් මිනිස් දින 11,515 ක් සඳහා දළ වැටුප් වියදම ලෙස රු. 28,328,800 ක් දරා තිබුණ ද, එය ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව අදහස් දක්වා නොතිබුණි. | පෞද්ගලික ආයතනයක ඉදිකිරීම් කටයුතු බැවින් වැටුප් වියදම හෝ කාර්මික කුලියක් ප්‍රතිපූරණය කරගත යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා නාවික හමුදාව "නිල් සයුරෙන් වට හරිත දේශයක් උදෙසා" යන්න තේමා කරගත් සමාජ වගකීම් ඉටු කිරීමේ මෙහෙවරක නියැලී ඇතත් පෞද්ගලික ආයතන ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයන් සඳහා නාවිකයින් යෙදවීම එම මෙහෙවරට අදාල නොවන කාර්යයන් බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධව අදහස් දක්වා නොතිබුණි. | මෙහෙවරට හා අරමුණු වලට අදාල කාර්යයන්වල නිරත විය යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන පරීක්ෂණ දිනට නාවික හමුදාව සතුව විවිධ මාදිලිවලට අයත් මෝටර් වාහන 3415 කින් යුත් ප්‍රවාහන ඇණියක් පැවති අතර ඉන් නාවික හමුදාවේ කාර්යයන් වෙනුවෙන් වාහන 3231 ක් යොදාගෙන තිබුණි. වාහන 03 ක් ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර වාහන 172 ක් අලුත්වැඩියා සඳහා භාර දී තිබුණි. ඉතිරි වාහන 09 ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වෙනුවෙන් යොදවා තිබුණි. | නාවික හමුදා වාහන සංචිතයෙන් ධාවනයෙන් ඉවත් කර ඇති රථ වාහන 25 ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ සුදුස්සක් කර විකුණා අවසන් කර ඇති අතර ඉතිරි වාහන 03 සුදුස්සක් කර විකිණීමට අවශ්‍ය ඉදිරි ක්රියාමාර්ග ගනිමින් පවති. අලුත්වැඩියා සඳහා යොමු කර තිබු වාහන 172හි අලුත්වැඩියා කටයුතු ලැබෙන සීමිත ප්‍රතිපාදන ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් අවසන් කිරීමට පියවර ගනිමින් පවතී. ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතන වෙත ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ යතුරුපැදි ඇතුළුව වාහන 10 ක් ලබා දිමටද කටයුතු කර ඇත. | වාහන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාගම වැලිසර නාවික කඳවුරෙහි තොරතුරු තාක්ෂණවේදය සම්බන්ධයෙන් නිපුණතාවය සහිත නිලධාරීන් සිටියද, ගිනි අවි සහ පතොරම් මිලදී ගැනීම් ඒකකයේ තොග සම්බන්ධයෙන් පද්ධති ක්‍රමයක් හඳුන්වාදීමට කටයුතු කර නොතිබුණි. | වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකයේ තොග සම්බන්ධයෙන් පද්ධති ක්‍රමයක් ඉදිරියේ දී හඳුන්වා දීමට කටයුතු කරනු ලැබේ. | පද්ධති ක්‍රමයක් මඟින් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාවික හමුදා පුද්ගල කාර්යය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ 486 ක්ද තෘතීය මට්ටමේ 6873ක්ද පුරප්පාඩු පැවතුනි. එසේම සිවිල් සේවක පුද්ගල කාර්යය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ 04 ක්ද , තෘතීය මට්ටමේ 11 ක්ද , ද්විතීය මට්ටමේ 72ක්ද, ප්‍රාථමික මට්ටමේ 480ක්ද පුරප්පාඩු වශයෙන් පැවතුනි. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020 පරිදි සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ඒ යටතේ වන සියලුම ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ දැනට පවතින සියලුම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් නැවත දැනුම් දෙන තුරු අත්හිටුවීමට කටයුතු කර ඇති | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

(අ) අංක 01/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව දැනට පවතින සියළුම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් නැවත දැනුම්දෙනතුරු අත්හිටුවා ඇති බැවින් සිවිල් කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට නොහැකි වී තිබුණි.

(ආ) ද්වීතික හා තෘතීක මට්ටමේ තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබුණි.

බැවින්, නාවික හමුදා සිවිල් කාර්ය මණ්ඩලයේ ප්‍රාථමික මට්ටමේ තනතුරු වල පවතින පුරප්පාඩු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට නොහැකි වී ඇත. ද්විතියික හා තෘතීය මට්ටමේ තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස දන්වා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව දැන්වේ.